Prepared by- ඩයනා පුෂ්පරාණී මිය

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

**5.3 නර්තන ශිල්පීන් අගයමු.**

**කේ.එස්.ප්‍රනාන්දු මහාතා.**



උපත - 1920.02.20 ගාල්ල දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ග්‍රාමයේදී.

පහතරට නර්තනයට මෙන්ම ගායනය,වාදනය,චිත්‍ර ශිල්පය,කැටයම් කලාව හා බලි ඇඹීම වැනි ශිල්පයන් මනාව ප්‍රගුණ කොට ඇත. ශාන්තිකර්ම වලට පමණක් සීමාවී තිබූ පහතරට නර්තනය ප්‍රසංග වේදිකාවට ගෙන ඒමේ ගෞරවය මෙතුමාට හිමිවේ.ගිරිදේවි නැටුම,සළුපාලිය,සුරඹා වල්ලිය,රතිරාග වන්නම,නාරිලතා වැනි නර්තන අංග මෙතුමාගේ නිර්මාණයන් වේ.ගුරුවරයෙකු හා රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයේ උපදේශකවරයෙකු ලෙස සේවය කර ඇත. යක් තොවිල් හා බලි යාග පිළිබඳ හසල දැනුමක් ඇති මෙතුමා සන්නියකුම හෙවත් දහඅට සන්නිය නමැති කෘතිය සම්පාදනය කළේය.ජනවේගය,මලකෝලම,මාහේනේ රීරි යකා,මිණි සළඹ යන නාට්‍ය වල රංගන නිර්මාණය මෙතුමා විසින් සිදු කරන ලදී.හෙළ රසාංග මෙතුමාගේ නිර්මාණ ප්‍රසංගයකි.

පැවරුම්

1.කේ.එස්.ප්‍රනාන්දු මහතාගේ සුවිශේෂී දක්ෂතා මොනවාද ?

2.මෙතුමා විසින් සිදුකල නිර්මාණ මොනවාද?